# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: DFD/MD/GPPP/Yala-2026

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2026.08.18

## මාධ්‍ය නිවේදනය

## 2026 යල කන්නයේ වී අස්වනු මිලදී ගැනීමේ කඩිනම් වැඩපිළිවෙළ

රජයේ සහතික මිල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් ගොවීන්ට තම අස්වැන්න සඳහා සාධාරණ මිලක් ලබාදීමත්, පාරිභෝගිකයින්ට දැරිය හැකි මිලකට වෙළෙඳපොළ තුළ සහල් විකිණීම තහවුරු කිරීමට හා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් නඟා සිටුවීමේත් අරමුණ ඇතිව සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සහ සමුපකාර සමිති හරහා ප්‍රමිතියෙන් යුතු වී තොග මිලදී ගැනීමට රජය තීරණය කර ඇත. මෙම වැඩසටහන කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ සහය ඇතිව දිස්ත්‍රික් ලේකම්වරුන් හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ජනාධිපති කාර්යාලයේ හා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ඇත.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ක්‍රමවේදය.

- වී මෙට්‍රික් ටොන් 25ක් උපරිම දෛනික කෙටුම් ධාරිතාවක් සහිත ලියාපදිංචි සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සහ එම ධාරිතාවයෙන් යුතු වී මෝලක් හිමි සමුපකාර සමිති මෙම වැඩසටහන සඳහා සුදුසුකම් ලබයි.
- රුපියල් මිලියන 25ක උපරිමයකට යටත්ව පොලී රහිත සහනදායී මූල්‍ය පහසුකමක් මෙම වැඩසටහනට සහභාගී වන සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සහ සමුපකාර සමිති වලට ලබා දෙනු ලැබේ.
- අදාළ ප්‍රදේශයේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර විසින් නිර්දේශ කරනු ලබන වී ප්‍රමාණය මෙම වැඩසටහන යටතේ ලියාපදිංචි වන සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සහ සමුපකාර සමිති විසින් රජයේ සහතික මිලට වී මිලදීගත යුතුය.
- රතු හා සුදු නාඩු ප්‍රමිතගත වී කිලෝග්‍රෑමයක් රජයේ සහතික මිල වන රු 120කටත් සම්බා ප්‍රමිතගත වී කිලෝග්‍රෑමයක් රු 130කටත් මෙම වැඩසටහන යටතේ ලියාපදිංචි වන සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හා සමුපකාර සමිති විසින් ගොවීන්ගෙන් මිලදීගත යුතුය.
- අරමුදල් ලබාගන්නා දින සිට උපරිම වශයෙන් දින 240ක කාල පරිච්ඡේදයක් තුළ මිලදී ගත් වී වෙළඳපොළ තුළ අලෙවිකර, ලබාගත් මුළු මුදල සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හා සමුපකාර සමිති විසින් පියවිය යුතුය. ඒ සඳහා කිසිදු පොලියක්, කොමිස් මුදලක් හෝ වෙනත් ගාස්තුවක් අය නොකෙරේ.

ඉහත ක්‍රමවේදය අනුව 2026 යල කන්නයේ වී අස්වනු මිලදී ගැනීමේ වැඩසටහන 2026.08.12 දින සිට ආරම්භ කළ බැවින් ඉහත සුදුසුකම් සපුරා ඇති සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සහ සමුපකාර සමිති මෙම වැඩසටහන සඳහා සහභාගී වීමට අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වන ලෙස දන්වා සිටිමි.